

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report

2024

සමුපකාර සේවක කොමිෂන් සභාව

கூட்டுறவு ஊழியர் சேவை ஆணைக்குழு

Co-operative Employees Commission

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2024

සමුපකාර සේවක කොමිෂන් සභාව

අංක 100 1/1, ලෝහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ල,

ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,

කොළඹ 02.

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සමුපකාර සේවක කොමිෂන් සභාව

වැය ශීර්ෂ අංකය : 302

අන්තර්ගතය		පිටු අංකය
01 පරිච්ඡේදය	- ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1-5
02 පරිච්ඡේදය	- ප්‍රගතිය හා ඉදිරි දැක්ම	6 -7
03 පරිච්ඡේදය	- වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	8 -20
04 පරිච්ඡේදය	- කාර්ය සාධන දර්ශක	21
05 පරිච්ඡේදය	- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	22
06 පරිච්ඡේදය	- මානව සම්පත් පැතිකඩ	23-24
07 පරිච්ඡේදය	- අනුකූලතා වාර්තාව	25-30

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3 ප්‍රධාන කාර්යයන්

1.4 සංවිධාන සටහන

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල - නැත

1.6 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත්සභාව යටතේ පවතින ආයතන/අරමුදල් - නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු - නැත

අ) ව්‍යාපෘතියේ නම ----

ආ) දායක නියෝජිතායතනය ----

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම ----

ඈ) ව්‍යාපෘති කාල සීමාව ----

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතෙහි 4 (2) වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුව සමුපකාර විෂය භාර ඇමතිවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත වේ. එම සාමාජිකයන් තිදෙනාගෙන් එක් අයකු කොමිෂන් සභාවේ සභාපති වශයෙන් පත් කරන අතර, එකී සාමාජිකයන් තිදෙනාම තම පත්වීමේ දින සිට අවුරුදු 03ක කාල සීමාවක් එකී ධූරයන් දැරිය යුතු වේ. එසේ වුව ද සාමාජිකයෙකුගේ ඉල්ලා අස් වීම, ඇමතිවරයා විසින් එකී ධූරයෙන් ඉවත් කිරීම, මිය යෑම වැනි කරුණු වල දී හිස් වූ පුරප්පාඩුවක් පිරවීමට තුන් අවුරුදු කාලයෙන් ඉතිරිව ඇති කාලයට වෙනත් සුදුසු අයකු පත් කිරීමට ඇමතිවරයාට හැකිවේ.

2024 වර්ෂයේ මාර්තු මස 03 දින සිය ධුර කාලය අවසන් වන තෙක් මෙම කොමිෂන් සභාවේ සභාපති ලෙස **ඩබ්.කේ.එම්.සරත් කීර්තිරත්න** මහතා කටයුතු කළ අතර, සෙසු සාමාජිකයන් ලෙස **සමන් කුමාර මුතුකුමාරණ** මහතා සහ **පී.ඩබ්.ඩී.ටී.පෙරේරා** මෙය කටයුතු කරන ලදී.

2024 වර්ෂයේ දෙසැම්බර් මස 10 වන දින සිට කොමිෂන් සභාවේ නව සභාපති ලෙස **නීතීඥ මනෝජ් නානායක්කාර** මහතා පත්වූ අතර සෙසු සාමාජික ලෙස **ජී. ජී. දයාසුමන** මහතා කටයුතු කරනු ලැබේ.

1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතෙහි 9 (1) වගන්තිය ප්‍රකාරව මෙම කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකු පත් කළ යුතුය. එකී ලේකම්වරයා මෙම දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා ද වේ.

2024 වර්ෂයේ කොමිෂන් සභාවේ ලේකම්වරිය ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිණියක වන **පවිත්‍රා ජයතිස්ස මහත්මිය** කටයුතු කරන ලදී.

1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතෙහි 9 (2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයෙහි සෙසු නිලධාරීන් ඒකාබද්ධ සේවාවන්ගෙන් පත් කරනු ලැබේ.

එම පනතෙහි 12 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ වියදම් මහා භාණ්ඩාගාර වාර්ෂික විසර්ජන පනත යටතේ වෙන් කරනු ලබන මුදල් වලින් සිදු කෙරේ. 2024 වර්ෂයේ වැය ශීර්ෂ 302 යටතේ විසර්ජන පනතින් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

<u>දැක්ම</u>

තෘප්තිමත් සමුපකාරික මානව සම්පතක් නිර්මාණය කිරීම.

<u>මෙහෙවර</u>

සමුපකාර ව්‍යාපාරයේ තිරසාර පැවැත්ම උදෙසා එම ක්ෂේත්‍රයෙහි මානව සම්පතෙහි අභිවෘද්ධිය පිණිස අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම.

<u>අරමුණු</u>

සමුපකාර මානව සම්පතෙහි අභිවෘද්ධිය සම්බන්ධයෙන් වන්නා වූ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ.

i. සමුපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත් කළමනාකරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය කිරීම.
ii. සේවා සුරක්ෂිතභාවය සඳහා නෛතික විධිවිධාන පැනවීම.
iii. සමුපකාර ක්ෂේත්‍රයේ කාර්මික ආරවුල් විසඳීම හා උපදේශන සේවා සැපයීම.
iv. සේවක අභිප්‍රේරණයට අවශ්‍ය ක්‍රියාවලින් නිර්මාණය හා මඟපෙන්වීම.

1.3 ප්‍රධාන කාර්යයන්

i. සමුපකාර සමිතිවලට සේවකයින් බඳවා ගැනීමේ දී, උසස් කිරීමේදී සහ ඔවුන්ට හිමි පාරිතෝෂික දීමනා ලබා දීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති නිශ්චය කිරීම.

ii. සමුපකාර සමිතිවල තනතුරුවලට පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් තීරණය කිරීම හා එවැනි තනතුරුවලට අදාළ වැටුප් පරිමාණයන් නියම කිරීම.


iii. සේවක ආරවුල් විසඳීම, අභියාචනා විභාග කිරීම සහ නියෝග ක්‍රියාත්මක කිරීම පැහැර හරින සමුපකාර සමිතිවලට එරෙහිව නීතීමය පියවර ගැනීම.

iv. කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරෙන අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීම.

v. ස්වකීය සේවකයින් සම්බන්ධයෙන් වූ විනයානුකූල ක්‍රියා මාර්ගයන්හිදී සමුපකාර සමිති විසින් අනුගමනය කල යුතු ක්‍රියාපටිපාටි තීරණය කිරීම.

vi. මානව සම්පත් සංවර්ධනය කිරීමේ සාකච්ඡා, සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

1.4 සංවිධාන සටහන


ලේකම්
ගණකාධිකාරි
නීති නිලධාරි
පරිපාලන නිලධාරි
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි
සංවර්ධන නිලධාරි
කළමනාකරණ සේවා නිලධාරි (සමිති)
කළමනාකරණ සේවා නිලධාරි (පාලන)
කළමනාකරණ සේවා නිලධාරි (ගිණුම්)
කාර්යාල කාර්ය සහයක
රියදුරු

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල - නැත

1.6 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන/අරමුදල් - නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු - නැත

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය

	2024 වර්ෂයේ දී ලැබී ඇති ප්‍රමාණය	විසඳුම් ලබා දී ඇති ප්‍රමාණය
අභියාචනා/ පැමිණිලි	81	01 *
උපදෙස් ඉල්ලීම්	25	11 *
සේවකයින් බඳවා ගැනීමට පූර්ව අනුමැතිය ඉල්ලීම්	344	11 *

* කොමිෂන් සභාවේ සභාපතිගේ හා සාමාජිකයින් දෙදෙනාගේ ධුර කාලය 2024.03.03 දිනෙන් අවසන් වූ පසු කොමිෂන් සභාව නැවත පත්කරනු ලැබුවේ 2024.12.10 දින බැවින් මාස නවයකට ආසන්න කාලයක් කොමිෂන් සභා තීරණ ලබා දී නොමැත.

- සමුපකාර සේවකයින්ට බලපාන කම්කරු නීතිය සහ සමුපකාර නීතිය පිළිබඳව සමුපකාර සමිති සේවකයින් දැනුවත් කිරීමේ වැඩමුළු 06 ක් පවත්වා ඇත. මෙම වැඩමුළු සඳහා සේවකයින් 310 ක් සහභාගී වී ඇත.

2.2 2025 වර්ෂය සඳහා ඉදිරි දැක්ම

- සමුපකාර සේවකයින් සඳහා නව වැටුප් වක්‍රලේඛයක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.

- සමුපකාර සේවා නියුක්තිකයක් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු 08ක් පැවැත්වීම.

දිනය: 2025.02.28

පවිත්‍රා ජයතිස්ස

ලේකම්

සමුපකාර සේවක කොමිෂන් සභාව

03 පරිච්ඡේදය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	කණ්ඩායම 2024 රු.	2023 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		21,890,700	21,425,642	ඒසිඒ-3
-	කැන්පතු		6,150	134,893	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		715,956	1,793,844	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**22,612,806**	23,354,379	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**22,612,806**	23,354,379	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		1,083,174	1,619,881	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		21,529,632	21,734,498	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
11,700,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	11,431,008	11,532,723	
11,700,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	7,379,031	7,145,450	ඒසිඒ-2(ii)
200,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	127,098	132,234	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
23,600,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**18,937,137**	18,810,407	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
550,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	613,693	-	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
550,000	හැකියා වර්ධනය	14	278,606	317,414	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
1,100,000	මුළු මූලධන වියදම් (උ)		**892,299**	317,414	
	කැන්පතු ගෙවීම්		6,150	134,893	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		999,091	1,580,922	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,005,241	1,715,815	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		20,834,677	20,843,636	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		694,956	890,862	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		694,956	890,862	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		694,956	890,862	ඒසිඒ-3

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

සමුපකාර සේවක කොමිෂන් සභාව ඒසිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2024 රු.	2023 රු.
		තත්‍ය	
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	25,447,564	24,833,871
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	2,179,210	1,896,075
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**27,626,774**	**26,729,946**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		2,179,210	1,896,075
දේපළ පිරියත හා උපකරණ සංචිතය		25,447,564	24,833,871
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**27,626,774**	**26,729,946**

පිටු අංක 7 සිට 25 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 26 සිට 31 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණකාදිමේ නිලධාරි	ගණකාදිමේ නිලධාරි	ගණකාධිකාරි
නම : කේ.ඒ. විමලේන්ද්‍රරාජා	නම : පවිත්‍රා ජයතිස්ස	නම : ඩී.යූ.ඒ.එදිරිසිංහ
තනතුර : ලේකම්	තනතුර : ලේකම්	
වෙළෙඳ,වාණිජ,ආහාර සුරක්ෂිතතා සහ	සමුපකාර සේවක කොමිෂන්	
සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය	සභාව	
දිනය :	දිනය : 20.02.2025	දිනය : 2025.02.20


කේ.ඒ. විමලේන්ද්‍රරාජා
ලේකම්
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ
සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

පවිත්‍රා ජයතිස්ස
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
අංක 100 1/1 ලොහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
කොළඹ 02

ඩී. යූ. ඒ. එදිරිසිංහ
ගණකාධිකාරී
සමුපකාර සේවක කොමිෂන් සභාව
අංක 100 1/1, ලෝහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය



2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

තක්ෂ

	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	21,890,700	21,425,642
අත්තිකාරම් අයකර ගැනීම්	220,330	808,982
තැන්පතු ලැබීම්	6,150	134,893
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**22,117,180**	**22,369,518**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	18,789,039	18,584,173
සහනාධාර සහ මාරුකිරීම්	127,098	132,234
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	220,330	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	1,083,174	1,619,881
අත්තිකාරම් ගෙවීම්	999,091	1,580,922
තැන්පතු ගෙවීම්	6,150	134,893
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**21,224,881**	**22,052,104**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**892,299**	**317,414**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	892,299	317,414
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**892,299**	**317,414**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(892,299)**	**(317,414)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම්

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට නහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* නම් වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම් යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාළ නොවේ

රු. ,000

ආදායම්කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
-	-	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	23,600	23,600	18,937	80.24%
ප්‍රාග්ධන	1,100	1,100	892	81.11%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - අදාළ නොවේ

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදන යේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
-	-	-	-	-	-	-

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	25,043	25,043	-	100%
9152	යන්ත්‍රෝපකරණ				
9153	ඉඩම්	-	-	-	
9154	අස්පෘශ්‍ය වත්කම්	403	403	-	100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරීගෙන යනවැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. TAC/G/CEC /2024/FS/15 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2025 මැයි 15 දින

ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව

ශීර්ෂය 302 - සමුපකාර සේවක කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 302 - සමුපකාර සේවක කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමුපකාර සේවක කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්,

මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකනාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව සමුපකාර සේවක කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණු සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකනාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ පනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සම්ස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(අ) 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි 7.6 ඡේදය පරිදි වැය විෂයයන් 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 66 හා 69 මාරු කිරීම් ගැලපීමෙන් පසු අගය මූල්‍ය කර්යසාධන ප්‍රකාශනයේ (ඒසිඒ- එස්) සංශෝධිත අයවැය ප්‍රතිපාදන තීරුවේ දැක්වීම් වෙනුවට එම ගැලපුම් වලට පෙර අගය දක්වා තිබුණි.

(ආ) සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම යටතේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉකුත් වර්ෂයට අදාළ පහත සඳහන් වැරදි නිවැරදි කර නැවත ප්‍රකාශිත අගයන් ලෙස ඇතුළත් කර නොතිබුණි.

	ඉකුත් වසරේ සම්පිණ්ඩන චාර්තාවට යොමුව	නිරීක්ෂණය
	---	---
1.6.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වර්ෂයේ තැන්පතු ලැබීම් සහ ගෙවීම් රු.106,868 ක් වැඩියෙන්ද, අත්තිකාරම් ගිණුම් ලැබීම් සහ අත්තිකාරම් ගෙවීම් රු. 106,868 ක් අඩුවෙන් ද දක්වා තිබුණි.	

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර නිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

වැය විෂයයන් 9 ක සියයට 59 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් පැවතීමෙන් මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකිතාක්දුරට සම්පූර්ණවත් නිවැරදිවත් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබු බව නිරීක්ෂණය විය.

3.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික විම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 6.1 හා 6.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) සමූපකාර සේවකයින් හා කාර්යාල සේවකයින් පුහුණු කිරීමේ වැඩසටහන් පිළිවෙලින් 8 ක් හා 2 ක් සඳහා රු. 449,000 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සමාලෝචිත වර්ෂයේදී වෙන් කරගෙන තිබුණද සමූපකාර සේවකයින් සඳහා වැඩසටහන් 6 ක් පමණක් පවත්වා තිබු අතර කාර්යාල සේවකයින් සඳහා පුහුණු වැඩසටහන් පවත්වා නොතිබුණි.

(ආ) කොමිෂන් සභාවේ නිල කාලය අවසන් වී නව පත්කිරීම් සිදු කිරීම මාස 9 කින් පමණ ප්‍රමාද වීම කොමිෂන් සභාවේ කාර්යසාධනය පහල මට්ටමක පැවතීමට හේතු වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබු පැමිණිලි සහ අභියාචනා 81 කින් 80 කට විසඳුම් ලබා දී නොතිබුණි. තවද සමිතිවලට උපදෙස් ඉල්ලීම් අවස්ථා 25 කින් 14 කට උපදෙස් ලබා දී නොතිබු අතර උපදෙස් ලබාදීමේ ප්‍රගතිය සියයට 44 ක් පමණක් විය. එසේම 2024 වර්ෂයේදී සමූපකාර සේවකයින් බදවා ගැනීමට පූර්ව අනුමැතිය ඉල්ලීම් 344 ක් ලැබී තිබුණු අතර ඉල්ලීම් 333 කට අනුමැතිය ලබා දී නොතිබු බැවින් එම කාර්යය ඉටුකිරීමේ ප්‍රගතිය සියයට 3 ක් පමණක් විය.

4.2 වත්කම් කළමනාකරණය

කොමිෂන් සභාව සතුව ධාවන තත්ත්වයේ පවතින වාහන දෙකක් හා අලුත්වැඩියා කළ හැකි තත්ත්වයේ පවතින එක් වාහනයක් වශයෙන් වාහන 03 ක් පැවතිය ද එක් රියදුරෙකු පමණක් අනුයුක්තව සිටින බැවින් වාහන ඌන උපයෝජිත තත්වයේ පැවතුණි.

5. නිරසාර සංවර්ධනය

5.1 නිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

හඳුනාගත් අරමුණු ලභාකර ගැනීමේ ප්‍රගතිය මැනබැලීමට පාදක වර්ෂයක් හා එම වර්ෂයේ පැවති තත්ත්වය පාදක දත්ත ලෙස හඳුනාගැනීම වෙනුවට ප්‍රවර්ථන වර්ෂයේ දත්ත භාවිතයට ගෙන

තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ලබාගත් ප්‍රගතිය සියයට 100 ක් ලෙස වාර්ෂික කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණි. එබැවින් සත්‍ය කාර්යසාධනය තහවුරු කරගත නොහැකි විය.

6. යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව, ගණන්දීමේ නිලධාරි විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ගත යුතු අතර එසේ නොමැති විට පනතේ 40 (2) පරිදි පනත ක්‍රියාත්මක වූ දින සිට වර්ෂ දෙකක් ඇතුළත එම තනතුර සඳහා පත්වීම් කළ යුතු වුවත්, සමාලෝචිත වසරේදීද එම තනතුර අනුමත කර ගෙන නොතිබුණි.

6.2 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියේ සඳහන් පරිදි 2024 වසර සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

7. මානව සම්පත් කළමනාකරණය

7.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා නත්‍ය කාර්ය මණ්ඩලය

(අ) 2024 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 23 ක් වූ අතර නත්‍ය සේවක සංඛ්‍යාව 13 ක් වූයෙන් පුරප්පාඩු 10 ක් විය.

(ආ)අනුමත කාර්ය මණ්ඩලය තුල නෘතිසික මට්ටමේ හා ද්විතියික මට්ටමේ නිලධාරීන් 14 ක් සිටිය යුතු වුවද නත්‍ය සේවක සංඛ්‍යාව 07 ක් වූයෙන් කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු වල අපේක්ෂිත කාර්යසාධන මට්ටම ලහාකර ගැනීමට බලපෑමක් සිදුවන බව නිරීක්ෂණය විය.

එස්.එම්.සී.ඉන්දිකා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
වැඩබලන විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම				
	100% - 90%	75% - 89%	50% - 74%	25% - 50%	0% - 25%
සමුපකාර සේවකයින් දැනුවත් කිරීමේ වැඩමුළු		✓			
සේවක පැමිණීලි සහ අභියාචනා විභාග කිරීම					✓
සමිතිවලට උපදෙස් ලබා දීම				✓	
බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබා දීම					✓

* කොමිෂන් සභාවේ සභාපතිගේ හා සාමාජිකයින් දෙදෙනාගේ ධූර කාලය 2024.03.03 දිනෙන් අවසන් වූ පසු කොමිෂන් සභාව නැවත පත්කරනු ලැබුවේ 2024.12.10 දින බැවින් මාස නවයකට ආසන්න කාලයක් කොමිෂන් සභා තීරණ ලබා දී නොමැත.

05 පරිච්ඡේදය

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/ අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
කාන්තා හා පුරුෂ දෙපාර්ශවයටම සියල්ලන් සඳහා පරිපූර්ණ හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා දිවිය පුරාම ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම.	දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීමේ දී කාන්තා හා පුරුෂ දෙපාර්ශවයටම සහභාගී වීම සඳහා සමාන අවස්ථාවන් ලබා දීම.	පුරුෂ සහභාගීත්වයේ ප්‍රතිශතයක් ලෙස කාන්තා සහභාගීත්වය	-	-	✓

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න. -

මෙහෙයුම් මට්ටමේ සේවක හිඟයක් පැවතීම හේතුවෙන් රාජකාරි කටයුතු/ අරමුණු අපේක්ෂිත මට්ටමින් සපුරාලීම අභියෝගයක් විය.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/(අතිර්ක්ත) **
ජ්‍යෙෂ්ඨ	03	03	-
තෘතීයික	01	00	01
ද්විතීයික	13	07	06
ප්‍රාථමික	06	03	03

6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ආයතනයේ කටයුතු පවත්වාගෙන යාමේදී මෙහෙයුම් මට්ටමේ සේවක හිඟයක් පැවතීම හේතුවෙන් රාජකාරි කටයුතු වල කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් ගැටළු මතුවීම සහ යම් අවස්ථාවන්හි දී අපේක්ෂිත මට්ටමේ අරමුණු නියමිත වේලාවට සපුරාලීමට නොහැකි වීම.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු. 000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම *
			දේශීය	විදේශීය		
2024 වසර තුලදී කාර්යමණ්ඩලය සඳහා පුහුණු අවස්ථාවන් සඳහා ඉල්ලීම් ඉදිරිපත් වී නොමැත.						

සටහන:

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

කාර්යමණ්ඩලයේ විෂයානුබද්ධ දැනුම වර්ධනය වීම හේතුවෙන් වඩා ඵලදායි සේවයක් සැපයීම සහ සේවක අභිප්‍රේරණය ඇති වීම තුළින් ආයතනයේ කටයුතු වල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට හේතුවේ. එසේ වුවත්, 2024 වසරේදී කාර්යමණ්ඩලය පුහුණු අවස්ථාවන් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර නොමැත.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා හේතු පැහැදිලි කිරීම	අනුකූල නොවන අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරීක්ෂණ
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරී ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත	අභ්‍යන්තර විගණක තනතුරක් ඇති කිරීමට කටයුතු කෙරේ
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත්කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත	අභ්‍යන්තර විගණක තනතුරක් ඇති කිරීමට කටයුතු කෙරේ
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අදාල නොවේ		

6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත	අභ්‍යන්තර විගණක තනතුරක් ඇති කිරීමට කටයුතු කෙරේ
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍ර ලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ රැස්වීම් සඳහා සහභාගී වේ.	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිළ දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	අතපසු වීමකින් යොමුකර නොමැත.	ඉදිරියේදී නිවැරදි කර ගැනීමට උපදෙස් ලබාදී ඇත.
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අදාල නොවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		

9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	සංචිත වාහන සඳහා සිදුකර නැත.	නිවැරදි කිරීමට උපදෙස් ලබාදී ඇත.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූළ වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		

14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවාදෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවියට හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2008(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධික්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	කාර්ය සාධන ගිවිසුම් සකසා නොතිබිණි.	කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීමට උපදෙස් ලබාදී ඇත.
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

01	ආයතනයේ කටයුතු පවත්වාගෙන යාමේදී මෙහෙයුම් මට්ටමේ සේවක හිඟයක් පැවතීම හේතුවෙන් රාජකාරි කටයුතු වල කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් ගැටළු මතුවීම සහ යම් අවස්ථාවන්හි දී අපේක්ෂිත මට්ටමේ අරමුණු නියමිත වේලාවට සපුරාලීමට නොහැකි වීම.
02	කාර්යමණ්ඩලයේ විෂයානුබද්ධ දැනුම වර්ධනය වීම හේතුවෙන් වඩා ඵලදායී සේවයක් සැපයීම සහ සේවක අභිප්‍රේරණය ඇති වීම තුළින් ආයතනයේ කටයුතු වල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට හේතුවේ. එසේ වුවත්, 2024 වසරේදී කාර්යමණ්ඩලය පුහුණු අවස්ථාවන් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර නොමැත.
03	අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත.
04	අභ්‍යන්තර විගණක තනතුරක් ඇති කිරීමට කටයුතු කෙරේ.
05	අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ රැස්වීම් සඳහා සහභාගී වී ඇත.
06	අතපසු වීමකින් යොමුකර නොමැත.
07	ඉදිරියේදී නිවැරදි කර ගැනීමට උපදෙස් ලබාදී ඇත.
08	සංචිත වාහන සඳහා සිදුකර නැත.
09	කාර්ය සාධන ගිවිසුම් සකසා නොතිබිණි.
10	කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීමට උපදෙස් ලබාදී ඇත.

01	Due to a shortage of operational staff in the running of the institution's activities, problems arise regarding the efficiency of duties and in some cases, the expected level of targets cannot be achieved on time.
02	The increased subject knowledge of the staff leads to more effective service delivery and employee motivation, which in turn increases the efficiency of the organization's operations. However, no requests for training opportunities were submitted by the staff in 2024.
03	There is no internal audit unit.
04	Steps are being taken to create an internal auditor position.
05	Participated in ministry audit and management meetings.
06	Not forwarded by mistake.
07	Instructions have been given for future corrections.
08	Not done for pool vehicles.
09	Performance agreements had not been prepared.
10	Instructions have been given to prepare performance agreements.

01	நிறுவனத்தின் செயற்பாடுகளை முன்னெடுப்பதில் செயற்பாட்டு ஊழியர்களின் பற்றாக்குறை காரணமாக, கடமைகளின் செயல்திறன் குறித்து சிக்கல்கள் எழுகின்றன. மேலும், சில சந்தர்ப்பங்களில், எதிர்பார்க்கப்படும் அளவிலான நோக்கங்களை உரிய நேரத்தில் அடைய முடியாதுள்ளது.
02	ஊழியர்களின் அதிகரித்த விடயதான அறிவு மிகவும் பயனுள்ள சேவை வழங்கல் என்பன ஊழியர்களை ஊக்குவிப்பதற்கு வழிவகுக்கின்றது, இது நிறுவனத்தின் செயல்பாடுகளின் வினைத்திறனை அதிகரிக்கின்றது. இருப்பினும், 2024 ஆம் ஆண்டில் பயிற்சி வாய்ப்புகளுக்கான கோரிக்கைகள் எதுவும் ஊழியர்களால் சமர்ப்பிக்கப்படவில்லை.
03	உள்ளக கணக்காய்வுப் பிரிவு காணப்படாமை
04	உள்ளக கணக்காய்வாளர் பதிவியினை உருவாக்குவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டு வருகின்றது.
05	அமைச்சின் கணக்காய்வு மற்றும் முகாமைத்துவ குழு கூட்டங்களில் கலந்து கொள்ளப்பட்டுள்ளது.
06	விடுவிக்கப்பட்டுள்ளதால் பரிந்துரை செய்யப்படவில்லை.
07	எதிர்காலத்தில் நிவர்த்தி செய்வதற்கு அறிவுறுத்தல்கள் வழங்கப்பட்டுள்ளன.
08	வாகன தொகுதிக்காக மேற்கொள்ளப்படவில்லை.
09	செயலாற்றுகை உடன்படிக்கைகள் மேற்கொள்ளப்படவில்லை.
10	செயலாற்றுகை உடன்படிக்கைகளினைத் தயாரிப்பதற்கான அறிவுறுத்தல்கள் வழங்கப்பட்டுள்ன.